ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>මඩකලපුව සනීපාරක්ෂක ඒකක ඉදිකිරීමේ ඉන්දියානු ප්‍රදාන ව්‍යාපෘතිය වේගවත් කෙරේ</u>

මඩකලපුව දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක ඒකක/වැසිකිළි ඉදි කිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමක් ඊයේ දින (ජූනි 5) නියෝජ්‍ය ඉන්දියානු මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතාගේ සහ ශ්‍රී ලංකා රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස සමරසිංහ මහතාගේ සම සභාපතීත්වයෙන් පැවැත්විණ. හයිබ්‍රිඩ් ක්‍රමයට පැවති මෙම රැස්වීම සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සහ අදාළ වෙනත් පාර්ශවකරුවන් ද සහභාගී වූහ.

2. මඩකලපුව දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක ඒකක ඉදිකිරීම ඉන්දියානු රජයේ ප්‍රදාන ව්‍යාපෘතියකි. ඊයේ දින පැවති ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම අතරතුර දී ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යය ඉහළ නැංවීම සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක ඒකක දහසකට අධික සංඛ්‍යාවක් ඉදිකිරීම වේගවත් කිරීමට අදාළ කරුණු සමාලෝචනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය නැගෙනහිර පළාත තුළ ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට ඉන්දියාව දක්වන අඛණ්ඩ කැපවීම පිළිඹිබු කරයි.

3. ඉන්දියාව ශ්‍රී ලංකාවට ලබා දී ඇති සමස්ත සංවර්ධන සහයෝගය ඇමරිකානු ඩොලර් බිලියන 5කට අධික අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 600කට ආසන්න ප්‍රමාණයක් ප්‍රදාන වේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ප්‍රදාන ව්‍යාපෘතීන් 65ක් පමණ දැනටමත් ක්‍රියාවට නංවා ඇත. දැනට ප්‍රදාන ව්‍යාපෘතීන් 20ක් පමණ ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරයන්හි පවතී. ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය සහ සුවසැරිය ගිලන් රථ සේවාව ඉන්දියානු ප්‍රදාන යටතේ විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති ප්‍රධානතම ව්‍යාපෘතීන් දෙකකි.

***

**කොළඹ**
**2023 ජූනි 5**